# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,952 - 2016 ජනවාරි මස 29 වැනි සිකුරාදා - 2016.01.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 490 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 492 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 502 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 පෙබරවාරි මස 19 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 පෙබරවාරි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති, ඒ ඒ තනතුරට ඉදිරියෙන් දක්වා ඇති සුදුසුකම් සහිත අයගෙන් 2016.01.30 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *සේවක ගණය* | *තනතුරු ප්‍රමාණය* | *වැටුප් පරිමාණය* |
|---|---|---|---|---|
| 01. | මාර්ග කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | 06/2006 - IV අනුව රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 |

*ප්‍රාථමික ශිල්පීය නොවන* :

*මූලික අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර),

(ආ) මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින එම ප්‍රාථමික ශිල්පීය නොවන තනතුර සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වශයෙන් එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියෙන් අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.

03. *වයස .-* සියලුම තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.

04. *වෙනත් සුදුසුකම් :*

(I) අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

(II) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය.

(III) අයදුම්කරුවන්/අයදුම්කාරියන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයන් විය යුතුය.

(IV) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(V) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(VI) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදළ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් සනාථ කළ යුතුය.)

(VII) දැනටමත් රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් වයස් සීමාව බල නොපවතින අතර, එකී පූර්වාසන්න වසර 05ක් තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

(VIII) අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

05. *අයදුම්පත් එවිය යුතු පිළිවෙල* :

සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරගත් අයදුම්පතක් 2016.02.15 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, කොබෙයිගනේ"යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "මාර්ග කම්කරු තනතුර සඳහා අයදුම්පත"යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනුපිටපත් ඇමිණිය යුතු ය :–

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතිකය
03. හැඳුනුම්පතේ පිටපතක්
04. ග්‍රාම නිලධාරී සහතිකය
05. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වූවන් නම් සේවා සහතිකය.

ආර්. ඒ. එන්. බී. රාජපක්ෂ,
ලේකම්,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

2016 ජනවාරි මස 11 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

**කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව**

01. (i) මුලකුරු සමග නම:——————————

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————

03. ජාතික හැඳුනුම්පත් අංකය:——————————

04. ස්ත්‍රී/පුරුෂභාවය:——————————

05. උපන් දිනය:

අවුරුද්ද :—————— මාසය:—————— දිනය:——————

06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු:—————— මාස:—————— දින:——————

07. විවාහක/අවිවාහක බව:——————————

08. ජාතිය :——————————

09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග:——————————

10. අධ්‍යාපන සුදුසුකම් :——————————

11. වෙනත් සුදුසුකම්:——————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව ඔප්පු වුවහොත් හෝ පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————————

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ............................................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................... වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :——————————.
(නිල මුද්‍රාව තබන්න)

01-1106

# පළාත් පාලන නිවේදන

## මැදගම ප්‍රාදේශීය සභාව

### සංශෝධනයයි

2015.12.04 දින අංක 1944 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (IV ආ වැනි කොටස - පළාත් පාලනය) මැදගම ප්‍රාදේශීය සභා ලේකම් ඒ. එම්. හේමරත්න බණ්ඩාර වන මා විසින් මැදගම ප්‍රාදේශීය සභාවට අදාළව 2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම, බලපත්‍ර මත ගාස්තු පැනවීම හා ප්‍රචාරක දැන්වීම් පළකිරීම පිළිබඳ ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පළකර ඇති නිවේදන වල පහත පරිදි සංශෝධනයන් සිදු කරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. හේමරත්න බණ්ඩාර,
සභා ලේකම්,
මැදගම ප්‍රාදේශීය සභාව.

2015 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

### (I) වරිපනම් බදු පැනවීම - 2016 වර්ෂය

*තීරණය*

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මැදගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2015 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2016 වර්ෂය සඳහා පිළිගැනීමටත්" මෙය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිවල, ඉඩම්වල හා ගෙපත්වල 2015 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2016 වර්ෂය සඳහා පිළිගැනීමටත්, යනුවෙන් සංශෝධනය කෙරේ.

### (II) මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2016 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

*යෝජනාව*

"ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මැදගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මැදගම ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්" මෙය

*තීරණය*

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මැදගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මැදගම ප්‍රාදේශීයසභාව විසින් 2016 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවෙ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්" යනුවෙන් සංශෝධනය කෙරේ.

### (III) ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම - 2016 වර්ෂය

*තීරණය*

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122, 126 වැනි වගන්ති ප්‍රකාර, මා වෙත පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර මැදගම ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීම් ඉදි කිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2016 වර්ෂය සඳහා පනවා අය කර ගැනීමට තීරණය කරමි." මෙය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122, 126 වැනි වගන්ති ප්‍රකාර, මා වෙත පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වන දින අංක 520/7 දරන පළාත් පාලන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සහ 2013.06.28 දින අංක 1816/43 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව මැදගම ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2016 වර්ෂය සඳහා පනවා අය කර ගැනීමට තීරණය කරමි" යනුවෙන් සංශෝධනය කෙරේ.

01-936

### දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත (272) වැනි අධිකාරය

අවිස්සාවේල්ල, නාපාවල එම්. ආර්. ෆාතිමා යස්මින් නැමැති අය අවිස්සාවේල්ල, නාපාවල එම්. එම්. එම්. නියාස් නැමැති අයට අයත් සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුළුගම කෝරළේ නාපාවල ගමේ පිහිටි රත්තෙවල්ලන්ගසින්නත්ගගේ වත්ත නැමැති ඉඩමේ 2016.12.31 දින දක්වා ගෝඝාතකාගාරයක් ඉදි කිරීමට අවසර ඉල්ලා ඇත.

මේ සම්බන්ධයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් ඔහු/ ඇය විරුද්ධ වීමට හේතු වූ කරුණු පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීමේ සඳහන් දින සිට දින 14 ක් ඇතුළත ලේඛනගත තැපෑලෙන් මා වෙත දැන්විය යුතු බව ගෝඝාතක පනතේ (272 වැනි අධිකාරය) 7(2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ජී. එස්. නිරෝෂන්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
දෙහිඕවිට.

2016 ජනවාරි මස 05 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ දී ය.

01-937

---

### ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

සංවර්ධනය නොකළ ඉඩම් විෂයෙහි බදු පැනවීම - 2016 වර්ෂය

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනත මගින් පැවරී ඇතිබලතල අනුව මහ නගර සභා ආඥාපනතේ 247 (ඈ) යන වගන්ති යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව විසින් 2016 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් විෂයෙහි බදු පැනවීම.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සුදුසුවන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ මෙම සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටක

අ ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ
ආ ඒ ඉඩමෙන් ගොඩනැගිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය යෝජනා සම්මතයක් මගින් සභාව විසින් නියම ලැබූ නියමිත අනුපාතයට වඩා අඩු නම් හෝ
ඇ ස්ථාවර නැතහොත් නිතිපතා කැරෙන ගොවිතැනට ඒ ඉඩම යොදවා නැත්නම්

එකී ඉඩම් සඳහා භූමියේ ප්‍රාග්ධන අගයෙන් පහත දක්වා ඇති පරිදි බදු පනවා ඇත.

1. පර්චස් 06ට වඩා අඩු ඉඩම් වල වර්ග අඩි 2000 දක්වා නිවාස ඉදි කිරීමට හැකියාව ඇති විටක එසේ නොවන අවස්ථාවල දී භූමියේ ප්‍රාග්ධන අගයෙන් 0.5%
2. පර්චස් 06 සිට 10 දක්වා ඉඩම් වල වර්ග අඩි 3000 ට අඩු නිවාස ඉදි කිරීමට හැකියාව ඇති විටක එසේ නොවන අවස්ථා වලදී භූමියේ ප්‍රාග්ධන අගයෙන් 1%
3. පර්චස් 10ට වැඩි ඉඩම් වල නිවාස ඉදි කිරීමට හැකියා ඇති විටක එසේ නොවන අවස්ථාවල දී භූමියේ ප්‍රාග්ධන අගයෙන් 1.5%

ඉහත 1, 2, 3 න් ආවරණය නොවන අවස්ථාවල දී භූමියේ ප්‍රාග්ධන අගයෙන් 2% ක ප්‍රමාණයක බද්දක් ඒ ඉඩමේ අයිතිකරු විෂයෙහි වාර්ෂිකව පනවා ඇත.

2015 අගෝස්තු මස 28 හා 2015 දෙසැම්බර් මස 17 දින පවත්වන ලද මහා නගර සභාවේ අංක 06:01 දරන සභා තීරණය ප්‍රකාර (සංශෝධන සහිතව) 2016 වර්ෂයට සහ ඉන්පසුව කෙරෙන සංශෝධනයන් අදාළ පරිදි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් ඉහත සඳහන් පරිදි සංවර්ධනය නොකළ ඉඩම් විෂයෙහි බදු පනවා අය කරන බව සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාන්තා පී ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2016 ජනවාරි මස 05 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා කාර්යාලය,
රාජගිරිය.

01-996

---

### කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලද අංක CLG-5/4/k/5 හා 2015.11.30, CLG-5/4/k/3 හා 2015.11.30, CLG-5/4/k/4 හා 2015.11.30, CLG-5/4/k4 හා 2015.10.26, CLG-13/1/19 හා 2014.11.19 දිනැති ලිපි අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස 03 ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී හා ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව, බුළුරුප්ප, හෙට්ටිමුල්ල

| | | |
|---|---|---|
| 01. පාරේ නම | - | කොළොන්ගල්ල ග්‍රේස්ලින් ජනපද මාර්ගය |
| වසම | - | කොළොන්ගල්ල |
| දිග | - | අඩි 1968 |
| පළල | - | අඩි 12 |


පාරේ වම්පස

1. ආර්. කේ. රාජපක්ෂ — බෝ කුඹුර
2. කපිල වේරගොඩ — ගුරුමුදුනේ කුඹුර
   කොළොන්ගල්ල ප්‍රධාන ඇළ

පාරේ දකුණු පස

1. ආර්.කේ. රාජපක්ෂ — බෝ කුඹුර
2. ඇන්. සිරිල් කුලතුංග — ගුරුමුදුනේ කුඹුර
3. ඩී. පී. රොසලින් — කැබලි අංක 09

01. කොළොන්ගල්ල ග්‍රේස්ලින් මාර්ගය



02. පාරේ නම - දිඹුල්ගමුව දෙඹටේවත්ත මාර්ගය
වසම - දිඹුල්ගමුව
දිග - මීටර් 175
පළල - මීටර් 2.4


පාරේ වම්පස

| | | |
|---|---|---|
| 1. | කේ. පී. ලැයිසා | දෙඹටේ පරණවත්ත |
| 2. | සුජීව පුෂ්ප කුමාර | යකදුරාදෙණිය කුඹුර |
| 3. | එච්. පී. එස්. කුමාරසිංහ | යකදුරාදෙණිය කුඹුර |
| 4. | ඩබ්. පී. ධර්මසේන | කෝන්ගහමුලහේන |
| 5. | ඩබ්. පී. චන්ද්‍රවතී | මුරුගේවත්තහේන |
| 6. | ඩබ්. ඩබ්. සී. වික්‍රමසිංහ | ගෙදරවත්ත |

පාරේ දකුණු පස

| | | |
|---|---|---|
| 1. | ඩබ්. පී. සරත් කුමාරසිංහ | යකදුරාදෙණිය කුඹුර |
| 2. | ජී. පී. එස්. කේ. විජේසිංහ | මිරිස්වත්ත |
| 3. | ඩී. පී. අනුලාවතී | හොක්කැවත්ත |
| 4. | ඩබ්. පී. අයි. පී. ශාන්ත කුමාරි | දෙඹටේහේන |
| 5. | ඩබ්. ඩබ්. සී. වික්‍රමසිංහ | කරගහලියන්නලාගේහේන |

02. දිඹුල්ගමුව දෙඹටේවත්ත මාර්ගය




03. පාරේ නම - උඩම්බා සියඹලාපිටිය හිටිනාවත්ත පාර
වසම - සියඹලාපිටිය
දිග - අඩි 80
පළල - අඩි 8

| පාරේ වම්පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 1. ඩබ්. ඒ. නවරත්න බංඩා<br>2. යූ. ආර්. ජයසේන<br>3. ආර්. සී. මනතුංග | හිටිනාවත්ත | 1. ආර්. සී. මනතුංග<br>2. සුනිල් කුලතුංග<br>3. අබේ වික්‍රමසිංහ | හිටිනාවත්ත |

## 03. උඩම්බා සියඹලාපිටිය හිටිනාවත්ත පාර

එම්.එස්.එම්.අජ්වාඩ්.
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
අංක 147 , හෙම්මාතගම පාර.
මාවනැල්ල.
දු.අංක 035-2247042
ලි.ප.අංක : 19930075

**පිඹුරු අංකය 9470 / 2015**




සැබෑ පිටපතකි.
.........................................
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

විස්තරය
පැවැ : පැල ඉෂි වැට
ගබැ : ගල් බැම්ම

පරිමාණය 1 : 1000

**සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ**
පරණකුරු කෝරළේ මැවත පත්තුවේ සියඹලාපිටිය ගමේ පිහිටි
වල්අරඹේවත්ත නොහොත් වල්අරඹේ හිටිනාවත්ත
නැමති ඉඩම මැන බලයලත් මිනින්දෝරු සී.කුරුකුලසූරිය මහතා විසින් සාදා ඇති අංක පී.2392 දරණ පිඹුරේ අංක 5 දරණ ප්‍රවේශ මාර්ගයේ කොටසක් නැවත මැන සාදන ලද කැබලි 1 ක
**පිඹුර**

සම්පූර්ණ බිම් ප්‍රමාණය.

| කැබලි අකය | බිම් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ. | රූ. | ප. |
| 1 | 0.0118 | 0 | 0 | 04.65 |
| එකතුව | 0.0118 | 0 | 0 | 04.65 |

මායිම් උපලේඛණය

| කැබලි අකය | මායිම් | | | |
|---|---|---|---|---|
| | උතුරට | නැගෙණහිරට | දකුණට | බස්නාහිරට |
| 1 | අංක 1066 දරණ පිඹුරේ කැබලි අංක 9 | අංක පී.2392 දරණ පිඹුරේ කැබලි අංක 1 | අංක පී.2392 දරණ පිඹුරේ කැබලි අංක 5 හි ඉතිරි කොටස සහ කැබලි අංක 3 | මහා මාර්ගය සහ අංක 1066 දරණ පිඹුරේ කැබලි අංක 9 |

මායිම් පෙන්වා දෙන ලද්දේ හිමිකරුවන් විසිනි.


2015 ජනවාරි මස 02 වෙනි දින මනින ලදි.

එම්.එස්.එම්.අජ්වාඩ්
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
එම්.එස්.එම්. අජ්වාඩ්
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ලි.ප.අංක : 19930075

| | | | |
|---|---|---|---|
| 04. | පාරේ නම | - | බුළුරුප්ප කොස්සින්න ඕලමුණුව පාලම දක්වා දිවෙන මාර්ගය |
| | වසම | - | බුළුරුප්ප |
| | දිග | - | අඩි 728 |
| | පළල | - | අඩි 12 |

| පාරේ වම්පස | පාරේ දකුණු පස |
|---|---|
| 1. ටී. ඒ. සුමනලතා පරණවත්තහේන | 1. එච්. ඇම්. ජයන්ත රත්නායක<br>2. කේ. එම්. කොළොන්ගහපිටිය } කුඹල්ඔළුව කුඹුර |


04. බුළුරුප්ප කොස්සින්න හරහා ඕලමුණුව පාලම දක්වා මාර්ගය



05. පාරේ නම - ගනේගොඩතැන්නවත්ත මාර්ගය
වසම - මාකුර
දිග - අඩි 203
පළල - අඩි 10

| පාරේ වම්පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 1. ඩී. චන්ද්‍රාවතී<br>2. ඩී. ලීලාවතී මැණිකේ | ගනේගොඩතැන්න | 1. ඒ. කේ. හීන්බංඩා<br>2. ඩී. විජේරත්න<br>3. ඒ. කේ. කේ. ඒකනායක<br>4. ඒ. කේ. චමින්ද පුෂ්පකුමාර | ගනේගොඩතැන්න |

5. ගනේගොඩතැන්නවත්ත මාර්ගය



06. පාරේ නම - සියඹලාපිටිය පහළගම පළමු පටුමග
වසම - සියඹලාපිටිය
දිග - අඩි 233
පළල - අඩි 8


| පාරේ වම්පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 1. පී. ඒ. වී. බන්දුලසිංහ<br>2. පී. ඒ. පියල් සුදසිංහ බංඩාර<br>3. කේ. ආර්. නලින් ශිරන්ත<br>4. බී. ඩී. රවිනි දිල්රුක්ෂි | හිටිනාවත්ත | 1. ඩබ්. ඒ. චන්ද්‍රදස<br>2. රුක්මන් රණසිංහ | හිටිනාවත්ත |

**06. සියඹලාපිටිය පහළගම පළමු පටුමග**

ඒ.සී.පී.ගුණසේන
බලයලත් මිනින්දෝරු
අංක 465, රන්වල
කෑගල්ල.
දු.අංක 035-2222807

පිඹුරු අංකය :- 1603/1

අංක 3 දරන කැබැල්ලේ උඩෘතය




පාර පළල අඩි 08
පාර දිග අඩි 220

සහතික කරනු ලැබේ.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

යොමුව
ඉ - ඉවුර
ගව: - ගල් වැට

පරිමාණය:- 1:1000

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
පරණකුරු කෝරළේ මාවත පත්තුවේ සියඹලාපිටිය ගමේ පිහිටි හිටිනාවත්ත නැමති ඉඩමේ
කොටසක ට ම විසින් මැන සාදා ඇති අංක 1603 හා 1999.09.29 දින දරණ පිඹුරේ පෙන්වන අංක 1
දරණ කැබැල්ල මැන කැබලි 7 කට බෙදා වෙන්කර පෙන්වන
- පිඹුර -

| කැබලි අංකය | ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ. | රූ. | ප. |
| 3 | 0.0173 | 0 | 0 | 06.85 |

(මායිම් ඉහත සඳහන් පරිදි වේ.)
2005 මැයි මස 18 වෙනි දින මැන බෙදා වෙන්කරන ලදී.
අංක 3 දරණ කැබැල්ලේ සත්‍ය උඩෘතයකි.

ඒ.සී.පී.ගුණසේන
බලයලත් මිනින්දෝරු
2015.04.22


ඒ. සී. පී. ගුණසේන
බලයලත් මිනින්දෝරු
අංක 465, රන්වල
කෑගල්ල.

අත්/කලේ/ඒ.සී.පී.ගුණසේ
බලයලත් මිනින්දෝරු
2005.05.24

| | | | |
|---|---|---|---|
| 07. | පාරේ නම | - | කලුගල්ල කුඹුරුයාය හරහා ජයසුනන්දරාම විහාරස්ථානය දක්වා මාර්ගය |
| | වසම | - | කලුගල්ල |
| | දිග | - | අඩි 2192 |
| | පළල | - | අඩි 12 |

| පාරේ වම්පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 1. ඩබ්. එම්. පුංචි නිලමේ | නිකදෙනිය | 1. අයි. ආර්. එල්. බී. ජයතිලක | පොල්කුඹුර |
| 2. පී. ආර්. ජී. වී. කේ. විජේසුන්දර | පොල්කුඹුර | | |


07. කලුගල්ල කුඹුරුයාය හරහා ජයසුනන්දරාම විහාරස්ථානය දක්වා මාර්ගය



08. පාරේ නම - පුස්සැල්ල කනත්ත යටිඅත පාර
වසම - පුස්සැල්ල
දිග - අඩි 243
පළල - අඩි 10

| | | |
|---|---|---|
| 1. | පී. වී. උදයකාන්ත | නාරංගහහේන |
| 2. | පී. එල්. අශෝකා ප්‍රියංගනි | |
| 3. | එච්. ඒ. බී. රළපනාව | |
| 4. | එච්. රවී. කුමාර | |
| 5. | පී. එල්. සරත් බංඩාර | |
| 6. | ජී. ඩබ්. ජයමන් රත්නායක | |
| 7. | පී. එල්. සීමන් පතිරාජ | |
| 8. | ඩබ්. ආර්. ජේ. වික්‍රමසිංහ | |

08. පුස්සැල්ල කනත්ත යටිඅත පාර




01-1116

# විවිධ දැන්වීම්

## රිදීගම ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා වාහන නවතා තැබීම සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු අය කිරීම

රිදීගම ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, රිදීගම ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජේ. ඒ. අජිත් කුමාරසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව රිදීගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදළව නවතා තැබීම සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කර නිවේදනය කරමි. එනම්,

වයඹ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභාවේ දී ස්ථිර කරන ලද බවට 2011.04.08 දිනැති අංක 1703/18 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV (ආ) වන කොටස මගින් ප්‍රකාශයට පත් කරන ලද 2011.07.28 දින රිදීගම ප්‍රාදේශීය සභාවේ මහ සභාව විසින් පිළිගෙන 2011.11.18 වැනි දින අංක 1733 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වන කොටසෙහි පළ කර වැළඳ ගනු ලැබූ අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනය පරිදි බල ප්‍රදේශයෙහි වාහන නවතා තැබීමට අදළව 2016 වර්ෂයට ගාස්තු අය කිරීමට රිදී ගම ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස මම නිවේදනය කරමි.

### උපලේඛනය

*ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාහන නවතා තැබීම*

1. *වාර්ෂික බලපත්‍ර ගාස්තු*

| | *රු. ශත* |
|---|---|
| ත්‍රිරෝද රථයකට | 500 0 |
| වෑන් රථයකට | 500 0 |
| ලොරි/බස් | 750 0 |

2. *පිටතින් එන වාහන සඳහා*

| | |
|---|---|
| ත්‍රිරෝද රථයකට | 20 0 |
| වෑන් රථයකට | 30 0 |
| ලොරි/බස් | 50 0 |

ජේ. ඒ. අජිත් කුමාරසිංහ,
ලේකම්,
රිදීගම ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 02 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-1107

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.